# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,878/5 — 1969 නොවැම්බර් 7 වැනි සිකුරාදා — 1969.11.7

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## අග්‍රාණ්ඩුකාරතුමාණන් කරන පත්කිරීම් ආදිය

අ.ආ.කා. අංකය : සී. 162ෂ49(7)

අග්‍රාණ්ඩුකාරතුමන් විසින් 1946 යේ හා 1947 තේ ලංකා (ආණ්ඩුක්‍රම හා ස්වාධීනතා) රාජාඥාවල 51 වැනි වගන්තිය යටතේ, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ අතිරේක ස්ථිර ලේකම්, ජේ. එල්. ඊ. ප්‍රනාන්දු මහතා තම රාජකාරිවලට අමතරව, 1969 නොවැම්බර් 5 වැනි දින සිට, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, බී. මහාදේව මහතා දිවයිනට පෙරළා පැමිණෙන තුරු, කෘෂිකර්ම හා ආහාර අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වශයෙන් වැඩ බැලීමට පත් කළ බව මෙයින් දනුම් දෙනු ලැබේ.

උතුමාණන් වහන්සේගේ අණ පරිදි,
ඒ. බී. ඇල්කඩුවේ,
අග්‍රාණ්ඩුකාරතුමාගේ ලේකම්.

1969 නොවැම්බර් 4 වැනි දින,
කොළඹ, අග්‍රාණ්ඩුකාරතුමාගේ කාර්යාලයේ දී.

11-54

---

## ශ්‍රී ලංකා මහ බැංකුවේ දන්වීම්

ශ්‍රී ලංකා මහ බැංකුව

මුදල් නීති පනත

වටිනාකම් සමකයන්

මුදල් නීති පනතේ 73 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාර, ලංකා රුපියලට විදේශීය ව්‍යවහාර මුදල් වල වටිනාකම් සමකයන්පි ළිබඳව, 1969 අගෝස්තු 22 වැනි දින හා අංක 14868/1 දරන ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනය, එහි ඇතුළත් උපලේඛනයේ දක්වන ලද වටිනාකම් සමකයන් වෙනුවට පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වටිනාකම් සමකයන් යෙදීමෙන් සංශෝධනය කරන ලද බව මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. තෙන්නකෝන්,
අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව.

1969 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ.

### උපලේඛනය

| රට | ව්‍යවහාර මුදල් ඒකකය | වටිනාකම් සමකයන් රුපියල් |
|---|---|---|
| ඇමෙරිකානු එක්සත් ජනපදය | ඩොලරය | 5.9524 |
| ඉතාලිය | ලීරා | 0.0095 |
| ඉන්දියාව | රුපියල | 0.7936 |
| එක්සත් අරාබි සමූහාණ්ඩුව | පවුම | 17.0926 |
| එක්සත් රාජධානිය | පවුම | 14.2857 |
| ඔස්ට්‍රේලියාව | ඩොලරය | 6.6666 |
| කැනඩාව | ඩොලරය | 5.5059 |
| ජපානය | යෙන් | 0.0165 |
| ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුව | ඩොයිට්ස්ට් මාක් | 1.6263 |
| ඩෙන්මාර්කය | ක්‍රෝන් | 0.7936 |

| රට | ව්‍යවහාර මුදල් ඒකකය | වටිනාකම් සමකයන් රුපියල් |
|---|---|---|
| තායිලන්තය | බාට් | 0.2862 |
| දකුණු අප්‍රිකාව | රන්ඩ් | 8.3333 |
| නවසීලන්තය | ඩොලරය | 6.6666 |
| නෙදර්ලන්තය | ගිල්ඩර් | 1.6443 |
| නෝර්වේ | ක්‍රෝන් | 0.8333 |
| පකිස්ථානය | රුපියල | 1.25 |
| පිලිප්පීනය | පෙසෝ | 1.5262 |
| ප්‍රංශය | ප්‍රැන්ක් | 1.0717 |
| බෙල්ජියම | ප්‍රැන්ක් | 0.1190 |
| බුරුමය | ක්‍යාට් | 1.25 |
| මැලේසියාව | ඩොලරය | 1.9444 |
| ස්විට්සර්ලන්තය | ප්‍රැන්ක් | 1.3612 |
| ස්වීඩනය | ක්‍රෝන් | 1.1506 |
| සිරියානු අරාබි සමූහාණ්ඩුව | පවුම | 2.7161 |
| හොංකොං | ඩොලරය | 0.9821 |

11–55

---

## ශ්‍රී ලංකා මහ බැංකුව

**1969 ඔක්තෝබර් මස 31 වැනි දිනට ශේෂ පත්‍රය**

**වගකීම්**

| | රු. | රු. |
|---|---|---|
| **ප්‍රාග්ධන ගිණුම්** | | |
| ප්‍රාග්ධනය ... ... | 1,50,00,000 | |
| අතිරික්තය ... ... | 5,50,00,000 | |
| | | 7,00,00,000 |
| **වගකීම්** | | |
| සංසරණයෙහි පවත්නා නෝට්ටු ... | 110,88,69,470 | |
| සංසරණයෙහි පවත්නා කාසි ... | 6,91,75,731 | |
| | | 117,80,45,201 |
| **තැන්පතු** | | |
| රජය ... ... | 1,92,56,502 | |
| රාජ්‍ය නියෝජ්‍යත්ව හා සංස්ථා ... | 63,66,964 | |
| වෙළෙඳ බැංකු ... ... | 14,13,44,084 | |
| ජාත්‍යන්තර සංවිධාන, විදේශීය රාජ්‍ය හා විදේශීය බැංකු ආයතන ... | 61,76,40,606 | |
| අනෙකුත් ... ... | 1,18,30,837 | |
| | | 79,64,38,993 |
| විදේශීය ණය ගැනීම්... ... | | 18,46,38,593 |
| අනෙකුත් වගකීම් හා ගිණුම් ... | | 85,91,87,499 |
| | | 308,83,10,286 |

**වත්කම්**

| | රු. | රු. |
|---|---|---|
| **ජාත්‍යන්තර සංචිතය** | | |
| පිටරට තිබෙන මුදල් හා බැංකු ශේෂයන් (භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව) | 5,49,31,482 | |
| * විදේශීය රාජ්‍ය ණයපත් ... | 10,13,54,042 | |
| | | 15,62,85,524 |
| **දේශීය වත්කම්** | | |
| ණය සහ අත්තිකාරම් : | | |
| † රජයට ... ... | 31,47,58,333 | |
| අනෙකුත් අයට ... ... | 9,01,25,000 | |
| රජයේ හා රජය සහතික කළ ණයපත්... | 173,99,09,881 | |
| | | 214,47,93,214 |
| අනෙකුත් වත්කම් හා ගිණුම් ... | | 78,72,31,548 |
| | | 308,83,10,286 |

* (අ) 1964 පෙබරවාරි මස 1 වැනි දින රු. 3,84,55,483 ක ප්‍රකාශිත වටිනාකමට හා (ආ) 1965 මැයි මස 24 වැනි දිනට රු. 2,42,17,726 ක වටිනාකමට රජයේ ආයතනවලින් ලබා ගත් ණයපත් ඇතුළත් වේ. ඒ දින වල මෙකී ණයපත්වල ඇස්තමේන්තු කළ වෙළෙඳ වටිනාකම පිළිවෙළින්, රු. 2,99,49,102ක් සහ රු. 2,07,35, 454 ක් විය.

† ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයන්ට ලංකාවේ දයක මුදල් වශයෙන් ගෙවීම සඳහා වූ රු. 8,94,58,333 ක විශේෂ ණය ද ඇතුළත් වෙයි.

ඩබ්ලිව්. තෙන්නකෝන්,
අධිපති.

කේ. ගුණරත්නම්,
ප්‍රධාන ගණකාධිකාරී.

ඉහත සඳහන් ශේෂ පත්‍රය මගේ විධානය යටතේ පරීක්ෂා කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ පොත් හා වාර්තා සහ මා වෙත සපයා ඇති තොරතුරු හා විස්තර අනුව, 1969 ඔක්තෝබර් මස 31 වැනි දිනට, මහ බැංකුවේ කටයුතු පිළිබඳ පැවැති තත්ත්වය සාධාරණව හා සත්‍යව පිළිබිඹු වන පරිදි ශේෂ පත්‍රය නිසි ලෙස සකස් කොට ඇති බව මගේ අදහස වෙයි.

ඩී. ආර්. සෙට්ටිනායක,
ඔඩිටර් ජනරාල්.

1969 නොවැම්බර් මස 7 වැනි දින, කොළඹ දී ය.

11–53

---

# මිල පාලන දැන්වීම්

**අංක : ම.දි. 144 දරන ආහාර මිල ආඥාව** **හරක් මස්**

**මිල පාලන පනත**

**ආඥාව**

(173 වන අධිකාරය) මිල පාලන පණතේ 4 වෙනි වගන්තිය සමග කියැවෙන 3 (2) වගන්තියෙන් මා වෙත පැවරෙන බලතල අනුව මහනුවර දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයෙන් සහකාර මිල පාලක (ආහාර) තැන්පත් ටියුඩර් කරුණාතිලක දසනායක වන මම, මෙම ආඥාව මගින් පහත සඳහන් නියමයන් කරමි :—

(1) 1967 දෙසැම්බර් 27 වන දින අංක 14,780/4 දරණ ලංකා ආණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1967 දෙසැම්බර් මස 24 වන දින අංක ම.දි. 140 දරණ ආහාර මිල නියෝගය මේ දුන් සිට මෙම නියෝගයෙන් අවලංගු කරමි.

(2) මෙහි වූ උපලේඛනයේ 2, 3 සහ 4 වැනි තීරයන්හි සඳහන් මිල, ඒ තීරයන්හි මුදුනේ සඳහන් වර්ගයට හා ශ්‍රෙණියට අයත් හරක් මස් ඒ උපලේඛනයේ 1 වැනි තීරයෙහි වූ අනුරූප සටහනෙහි සඳහන් ප්‍රදේශය තුළ විකිණිය යුතු උපරිම මිල ලෙස වහාම ක්‍රියාත්මක කළ යුතුයි.

(3) මෙම නියෝගයේ කාර්‍ය්‍යය සඳහා—

(අ) 'හරක් මස්' යන පාඨයට එළ හරක් හා මීහරක් මාංස පමණක් ඇතුළත් වන අතර මාංසාවශේෂ කිසිවක් ඇතුළත් නොවේ.

(ආ) සතකුගේ මළකුණ විකිණීම සඳහා මස් මඩුවේදී පිළියෙළ කොට ඇති අයුරින් (එනම්, හිස, හම, බඩවැල්, මාංසාවශේෂ, කුර සහ සාමාන්‍යයෙන් ඉවත් කරනු ලබන කොටස් හැර) විකුණන විට එය තනි බර අනුව කෙරෙන විකිණීමක් ලෙස සැලකිය යුතුයි.

(4) කටු සහිත හරක් මස් විකිණීමේදී මේ සමග විකුණු කටුවල බර විකුණු මුළු බරින් සියයට 25 කට වැඩි නොවිය යුතුය.

(5) මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබා ගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වර්ගයේ හෝ ශ්‍රෙණියේ හරක් මස් සම්බන්ධයෙන් මේ නියෝගයෙන් නියමිත උපරිම මිල සඳහන් කළයුතු දැන්වීමක් එකී ස්ථානයේ, පැහැදිළිව පෙනෙන ලෙස ප්‍රදර්ශණය කළයුතුයි.

(6) හරක් මස් විකිණිය යුත්තේ නැතහොත් විකිණීම සඳහා ප්‍රදර්ශනය කළයුත්තේ ඒ සඳහා වෙන් කොට ඇති වෙළඳ පිල්වල පමණක් වූ අත එම වෙළඳ පිල්වල වෙනයම් වර්ගයක හෝ ශ්‍රෙණියක මස් විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කිරීම හෝ නොකළයුතුයි.

(7) මෙහි වූ උපලේඛනයෙහි 1 වැනි තීරයෙහි සඳහන් ප්‍රදේශය ඇතුළත වූ යම් ස්ථානයක ඒ උපලේඛනයෙහි සඳහන් වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් තම සන්තකයෙහි තබාගෙන ඇති සෑම වෙළෙන්දෙකුම ඒ වෙළඳපිලෙහි එම වර්ගයට සහ ශ්‍රෙණියට අයත් හරක් මස් පමණක් විකුණන බවට ඒ හරක් මස් විකුණන වෙළඳ පිලෙහි පැහැදිලිව පෙණෙන ලෙස දැන්වීමක් ප්‍රදර්ශණය කළයුතුය.

(8) කටු සහිත හෝ රහිත හරක් මස් මාංසාවශේෂ සමග එක් ගණුදෙනුවක් වශයෙන් විකිණීමේදී කටු සහිත හෝ කටු රහිත හරක් මස් මාංසාවශෙෂවලින් වෙන් කර කිරා විකිණිය යුතු බව මෙයින් නියෝග කරමි.

(9) හරක් මස් විකුණනු ලබන සෑම තැනැත්තකු විසින්ම, යම් කෙනෙකු විසින් හරක් මස් ඉල්ලූවිට මාංසාවශේෂයෙන් තොර හරක් මස් පමණක් විකිණිය යුතුයි.

(10) සෑම වෙළෙන්දකුම හරක් මස් විකුණන කල්හි, හරක් මස් ගැණුම්කරු විසින් මිලට ගන්නා හරක් මස් ප්‍රමාණයෙහි සැබෑ බර පහසුනේව බලාගැනීමට හැකි වන සේ තම තරාදිය හෝ තරාදි හෝ තැබිය යුතුයි.

(11) මෙහි වූ උපලේඛනයෙහි සඳහන් වර්ගයේ සහ ශ්‍රෙණියේ හරක් මස් විකුණන සෑම වෙළෙන්දකුම, හරක් මස් ගැණුම්කරු විසින් ඉල්ල සිටි විට පහත සඳහන් කරුණු දක්වෙන කුවිතාන්සියක් ඔහුට දිය යුතුයි :—

(අ) විකුණු දිනය;

(ආ) විකුණු හරක් මස් ප්‍රමාණය (බර අනුව);

(ඇ) විකුණු හරක් මස් වර්ගය; හා

(ඈ) විකුණු හරක් මස් ප්‍රමාණයට ගෙවූ මිල.

(12) මෙම නියෝගයෙන් උපරිම මිල නියම කරන ලද සෑම ප්‍රදේශයක් තුළ ම කිසිවකු විසින් උපලේඛනයේ සඳහන් භාණ්ඩය වෙන කිසියම් මසක් හෝ මාංසයක් හෝ සමග කලවම් කොට නොවිකිණිය යුතුයි.

(13) උපලේඛනයෙහි සඳහන් භාණ්ඩය විකුණන කල්හි ඒ භාණ්ඩය ඔතා හෝ බහා හෝ දෙන කිසියම් ද්‍රව්‍යයක් වුවහොත් එහි මිල ද එම උපලේඛනයෙහි 2, 3 හා 4 වැනි තීරයන්හි සඳහන් උපරිම මිලට ඇතුළත් විය යුතුයි.

(14) මෙම නියෝගයෙහි කාර්‍ය්‍යය සඳහා 'රාත්තල' හෙවත් 'රා' යන්න ඇවෝර්ඩුපොයි බර ක්‍රමය අනුව සම්මත රාත්තලේ බර ලෙස සැළකිය යුතුයි.

1969 නොවැම්බර් මස 4 වෙනි දින පෙ.ව. 9.30 ට මහනුවර කච්චේරියේදී අත්සන් කරන ලදී.

ටී. කේ. දසනායක,
සහකාර මිල පාලක (ආහාර)
මහනුවර දිස්ත්‍රික්කය සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ
උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය.

උපලේඛනය

| 1 වෙනි තීරය | 2 වෙනි තීරය | 3 වෙනි තීරය | 4 වෙනි තීරය |
|---|---|---|---|
| ප්‍රදේශය | කටු රහිත හරක් මස් රාත්තලක් විකිණිය හැකි වැඩිම මිල | හරක් මස් කටු සහිත රාත්තලක උපරිම මිල | හරක් මස් තනි බර අනුව රාත්තලක උපරිම මිල |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| මහනුවර ආදායම් දිස්ත්‍රික්කයේ සහ නුවරඑළිය දිස්ත්‍රික්කයේ උඩහේවාහැට ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය ... ... ... | 1. 20 ... | 1. 00 ... | 0. 90 |

**සටහන.**—(1) මේ මිල ගණන් ඉහත සඳහන් ද්‍රව්‍ය විකිණීමේ නියමිත මිල නොවේ. මේවා ඒ ඒ ද්‍රව්‍යවල විකිණිය හැකි උපරිම මිල ගණන් වේ. මේ මිල ගණන්වලට ඉහළින් ඒ ඒ ද්‍රව්‍ය විකිණීමට නොහැකිය.

11–56

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කෙරිණි.